සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

52 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 13 - 2018

විභාග අංකය ..................................

## නර්තනය (දේශීය) I

කාලය පැය දෙකයි

වැදගත්
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

❖ **උපදෙස්: මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. කොහොඹා දෙවියන්ගේ උපත පිළිබඳව සඳහන් වන ගායන සහිත නර්තනාංගය ඇතුළත් ශාන්ති කර්මය වන්නේ,
1. පහන් මඩුව ය. 2. දෙවොල් මඩුව ය. 3. කිරි මඩුව ය.
4. කොහොඹා කංකාරි ය. 5. කඩවර කංකාරි ය. (........)

02. මාත්‍රා 3 ට හා 3 + 4 යන තාල රූපයන් දෙකටම ගැයෙන වන්නම වන්නේ,
1. උරගා 2. මුසලඩි 3. උකුසා 4. සුරපති 5. කිරළා (........)

03. 'එක් දින මොහොතින් නැකත ද රැගෙනේ'..... මෙය
1. මෝල්ගස් නැටුමේ කවියකි. 2. ග්‍රහ පංති කවියකි.
3. හත් අඩියේ කවියකි. 4. කොහොඹා හැල්ලේ කවියකි.
5. කඩතුරා කවියකි. (........)

04. 'තක රොං දං ගජිං ජිකුද ..... යන අඩව්ව අයත් වට්ටම වනුයේ,
1. කුද කුජිගත වට්ටම 2. දොං ජිංත ගත දොංත වට්ටම
3. කුදංත ගත දොං වට්ටම 4. දොගොර ජිං ගජිං ගජිගත වට්ටම
5. ගොග් ගොග් ජිං ජිංගත වට්ටම (........)

05. චිත්‍ර කලාවේ 'උන්නත' යන සංකල්පය නර්තනය කලාව හා බැඳි අවස්ථාවකි.
1. බලි ඇඟීම 2. බලි ඇදීම 3. බලි බැස්ස සැකසීම
4. වස්ත්‍ර සැකසීම 5. වර්ණ ගැන්වීම (........)

06. කොහොඹා කංකාරි ශාන්ති කර්මය තුළ යකුන් කැඳවීම හා යකුන් පලවා හැරීමේ අරමුණින් කරනු ලබන නර්තන අංග දෙකකි.

1. ආවැන්දුම හා දුම්මල පදය 2. යක් ඇනුම හා අස්නෙ

3. ආවැන්දුම හා යක් ඇනුම 4. යක් ඇනුම හා කෝල්පාඩුව

5. යක් ඇනුම හා යක්තුන් පදය (........)

07. සාම්ප්‍රදායික ගති ලක්‍ෂණ ආරක්‍ෂා කර ගනිමින් හඬ පාලනයෙන් යුතුව බෙර වාදනය කිරීමේදී අවධානය යොමු කළ යුතු වන්නේ,

1. තාලය හා ලය කෙරෙහි ය. 2. දඟී දොඹිය හා ලක බුරුල කෙරෙහි ය.

3. ලක බුරුල හා ලය කෙරෙහි ය. 4. තාලය හා ලක බුරුල කෙරෙහි ය.

5. දඟී දොඹිය හා තාලය කෙරෙහි ය. (........)

08. තෝරාගත් සීමිත අවකාශයක් තුළ තම නිර්මාණය හසුර වන්නේ,

1. රංග භාණ්ඩ නිර්මානයේදී හා රංග අලෝකරණයේදී ය.

2. අංග රචනයේ දී හා සංගීත රචනයේ දී ය.

3. රංග රචනයේදී හා චිත්‍ර සම්පිණ්ඩනයේ දී ය.

4. කැටයම් කලාවේ දී හා රංග වස්ත්‍ර නිර්මාණයේ දී ය.

5. සාහිත්‍යකරණයේදී හා චිත්‍රපටකරණයේදී ය. (........)

09. මුසලඩි වන්නමට නර්තනය කළ හැකි අඩව්ව මින් කවරක්ද?

1. තත් තකට තක රොං 2. ගත්ත තෙහිගු තකට තකුද 3. ජෙහිං කුද තත් තත් තත්

4. තාක්කු තත් කුං තරිකිට 5. තාං දොමිති ගත දොමිකිට (........)

10. දේශීය මුද්‍රා නාට්‍ය බිහිවීමට මූලික අඩිතාලම වූයේ,

1. බටහිර බැලේ නාට්‍ය කලාවයි. 2. දේශීය සාම්ප්‍රදායික නර්තනයයි.

3. නාඩගම් නාටක කලාවයි. 4. ගැමි නාටක කලාවයි.

5. භාරතීය නෘත්‍ය නාටක කලාවයි. (........)

11. ප්‍රාසංගික වේදිකාවේ නර්තනාංගයකට ආලෝකය සැපයීමේදී වඩාත් සැලකිය යුත්තේ,

1. සංගීතය සහ නර්තන ශිල්පීන් පිළිබඳව ය.

2. රංග වස්ත්‍රවල වර්ණ සහ අමු ද්‍රව්‍ය කෙරෙහි ය.

3. නර්තන අංගය අයත් නර්තන සම්ප්‍රදාය පිළිබඳව ය.

4. වේදිකාවේ හැඩය සහ වේදිකා සැරසිලි පිළිබඳව ය.

5. නර්තන නිර්මාණය සහ අංග රචනය පිළිබඳව ය. (........)

12. මණිපුරි නර්තන සම්ප්‍රදාය ගුරුකොට ගනිමින් රවීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් නිර්මාණය කරන ලද නෘත්‍ය නාටක වන්නේ,

1. දේව විජය, චිත්‍රාංගදා සහ ශ්‍යාමා 2. ක්‍රිෂ්ණලීලා, ධරණී හ ාමාලාවිකාග්නි මිත්‍රා

3. මේනකා ලාස්‍යම්, චණ්ඩාලිකා හා ශාප් මෝචන් 4. චිත්‍රාංගදා, ශාප් මෝචන් හා චණ්ඩාලිකා

5. ජීවන රිද්මය, කල්පනා හා ශාප් මෝචන් (.......)

13. 'බල්තසාර් ඩි බොජෝයස්' විසින් ඉදිරිපත් කරන ලද බැලේ නාට්‍යයකි.

1. ස්වෝන් ලේක් 2. ස්ලීපිං බියුටි 3. බැලේ කොමික් ඩි ලා රෙනේ
4. 'ල ට්‍රියෝම්ෆ් ඩ ලමූර්' 5. 'මෙඩියා සහ ජනෝන් (........)

14. සන්නිවේදන කාර්යයෙහිලා බෙර වාදනය යොදාගත් අවස්ථාවන් ලෙස දැක්විය හැක්කේ,

1. රණ බෙර, අණ බෙර සහ මළබෙර
2. රණ බෙර, හේවිසි බෙර සහ අත්‍යා බෙර
3. අත්‍යා බෙර, පිං බෙර සහ පූජා බෙර
4. මඟුල් බෙර, මළ බෙර, සහ යහන් බෙර
5. මළ බෙර, රණ බෙර හා පිං බෙර (........)

15. උඩරට මඟුල් බෙර වාදනයේ දී 'තරිකිට කුංදත් කුංදත් ජිං ජිං ...... යන්නෙන් ආරම්භ කෙරෙනුයේ,

1. දේව පදය යි. 2. ආශිර්වාද පදය යි. 3. ගුරු පදය යි.
4. වට්ටම් පිරීමයි. 5. පළමු වැනි වට්ටමයි. (........)

16. වෙස් මෝස්තර නිර්මාණයේදී පුරාණයේ වැඩි වශයෙන් දක්නට ලැබුනේ,

1. විසිතුරු රංග වස්ත්‍රාභරණ සහ වෙස් මුහුණු භාවිතයයි.
2. තාක්‍ෂණ ක්‍රම වේද සහ කෘතීම ආලේපන භාවිතයයි.
3. සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ හා කෘතීම ආලේපන භාවිතයයි.
4. ස්වාභාවික අමුද්‍රව්‍ය සහ කෘතීම අමුද්‍රව්‍ය භාවිතයයි.
5. සාම්ප්‍රදායික රංග වස්ත්‍ර සහ ස්වාභාවික අමු ද්‍රව්‍ය භාවිතයයි. (........)

17. මළ බෙර වාදනයේ දී හඬ පාලනය සඳහා භාවිතා වන ශිල්ප ක්‍රමයකි.

1. දවුල අතින් පමණක් වාදනය කිරීම. 2. හැකි පමණ හඬ අඩුවෙන් වාදනය කිරීම.
3. වාදන ශිල්පීන් අඩුවෙන් යොදා ගැනීම. 4. සුදු පිරිවටයකින් බෙර ඇස වසා වාදනය කිරීම.
5. වාදන භාණ්ඩ සුසර නොකිරීම. (........)

18. බැලේ නර්තන කලාවේ 'මී මුත්තා' ලෙස හඳුන්වනු ලබන 'ජීන් ජෝර්ජ් නෝර්වේ' උපත ලබන්නේ,

1. 1727 අප්‍රේල් 29 වන දින ඉතාලියේ ය. 2. 1727 අප්‍රේල් 29 වන දින ප්‍රංශයේ ය.
3. 1727 අප්‍රේල් 29 වන දින එංගලන්තයේ ය. 4. 1727 අප්‍රේල් 29 වන දින රුසියාවේ ය.
5. 1727 අප්‍රේල් 29 වන දින ඇමෙරිකාවේ ය. (........)

19. ''හංසවිල'' 'බැලේ නාට්‍යයෙහි 'ඔඩෙට්' ගේ චරිතයත් 'මියගිය හංසයා' හි' හංසයා ගේ චරිතයත් මැනවින් නිරූපනය කළ නිළියන් දෙදෙනා වන්නේ,

1. ගලීනා උලනෝවා හා තමාරා තව්මනෝවා ය.
2. ඇනා පව්ලෝවා හා ගලීනා උලනෝවා ය.
3. ගලීනා උලනෝවා හා ඇනා පව්ලෝවා ය.
4. පියාගෝ ලෙග්නානි හා පොලීනා කර්පාකෝවා ය.
5. තමාරා තව්මනෝවා හා ඇනා පව්ලෝවා ය. (........)

20. පහතරට රට යකුමෙහි ස්ත්‍රියක ලෙස සමාරෝපය වී නිරූපණය කරනු ලබන්නේ,

1. රිද්දි බිසව් ලෙස ය. 2. දෙවොල් දෙවි ලෙස ය. 3. ගිරි දේවිය ලෙස ය.
4. සූනියම් දෙවිය ලෙස ය. 5. පත්තිනි දේවිය ලෙස ය. (........)

21. 

ඉහත රූපයෙන් දැක්වෙන්නේ,

1. උඩරට වෙස් ඇඳුම් කට්ටලයයි. 2. පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයයි.
3. පහතරට තෙල්මෙ ඇඳුම් කට්ටලයයි. 4. බලි ඇඳුම් කට්ටලයයි.
5. සබරගමු පබළු ඇඳුම් කට්ටලයයි. (........)

22. එම ඇඳුම් කට්ටලය සකස් කිරීමේදී භාවිතා කොට ඇති අමුද්‍රව්‍ය වන්නේ,

1. කාඩ්බෝඩ්, ගොක්කොළ, පබළු 2. පබළු, රෙදි, ගොක් රූහැන්
3. රෙදි, රේන්ද, රෙජිෆෝම් 4. රෙදි, පබළු, රේන්ද
5. රෙදි, කාඩ්බෝඩ්, රේන්ද (........)

23. 'එක් කරවා රුසි නව දෙන ඉතිනේ.... ' මෙහි

1. ලඝු 08 යි ගුරු 06 යි 2. ලඝු 10 යි ගුරු 03 යි 3. ලඝු 06 යි ගුරු 05 යි
4. ලඝු 12 යි ගුරු 04 යි 5. ලඝු 10 යි ගුරු 02 යි (........)

24. ඉන්දියානු නර්තන කලාවන් පිළිබඳ අධ්‍යයනය සඳහා පරිශීලනය කළ හැකි ග්‍රන්ථයකි.

1. ඩබ්. ඩී. මකුලොළුව මහතාගේ 'හෙළ ගී මඟ'
2. එම්. එච්. ගුණතිලක මහතාගේ 'නාට්‍ය දෘෂ්ඨී සහ රත්නාවලී'
3. විමල් අභයසුන්දර මහතාගේ 'සංගීත සංහිතා'
4. සී. ද එස් කුලතිලක මහතාගේ 'සංගීත සම්භවය'
5. වින්සන්ට් සෝමපාල මහතාගේ 'දස තාල ලක්‍ෂණය' (........)

25. දේශීය නර්තනයට සෘජුවම සම්බන්ධ වන අවනද්ධ භාණ්ඩ ලෙස සැලකෙන්නේ,

1. ගැටබෙර ය, පහතරට බෙරය, දවුල සහ උඩැක්කියයි.
2. ගැටබෙරය, තම්මැට්ටම, දවුල හා දඬු බෙරයයි.
3. ගැටබෙරය, දෙවොල් බෙරය, දවුල හා දඬු බෙරයයි.
4. ගැටබෙරය, උඩරට බෙරය, දවුල හා තම්මැට්ටම
5. උඩරට බෙරය, පහතරට බෙරය, තම්මැට්ටම හා උඩැක්කිය (........)

❖ **26-35 තෙක් හිස්තැන්වලට අදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න,**

26. සිරිවස්තු පුර මංගල උත්සවයකින් නැගුණු තූර්ය වාදන නාදයක් පිළිබඳ ........................................... කෘතියෙහි සඳහන් වේ.

27. ගද්‍ය, පද්‍ය යන කොටස් දෙකම අන්තර්ගත .................................................... සී පද සුවිශේෂී ගායන විශේෂයකි.

28. ඉම්පීරියල්, බෝල්ෂෝයි, සිකි යනු ................................. බැලේ නාට්‍ය සමාගම් ය.

29. දෘත ලයට කරනු ලබන වාදනයක් වන පුරප්පට්ටු වාදනය සඳහා ......................................................... යොදා ගනු ලබයි.

30. 'නොනැවත යනු නැත එතැනින්' මෙම කවි පදය ................................................ ට අයත් වන්නකි.

31. කාන්තාවන් උදෙසා පවත්වනු ලබන කුමාර සමයම .......................................... නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්මයකි.

32. 'තකුද ගජ්ජි තක ජිජි කුං .... මෙම පද කොටසින් ආරම්භ කරනු ලබන්ගේ කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ................................................. නර්තන අංගයයි.





33. ඉහත රූපවලින් දැක්වෙන අතිමානුෂ චරිත දක්නට ලැබෙන්නේ ............................................... යෙහි ය.

34. 1 රූපයේ නාග රාක්ෂ මුහුණ ද 2 රූපයෙන් ................................................ මුහුණ ද දැක්වේ.

35. 'ක්‍රිෂ්ණ ලීලා ' 'දේව විජය', 'මේනකා ලාස්‍යම්' යන නෘත්‍ය නාටක නිර්මාණය කරන ලද්දේ ........................................................ ශිල්පිනිය විසිනි.

❖ **ප්‍රශ්න අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුර තිත් ඉර මත ලියන්න.**

36. මරු සන්නිය සහ දෙකොන විලක්කු සමයම චරිත අංග රචනයේ දී යොදාගත් ස්වාභාවික අමු ද්‍රව්‍ය දෙකක් සඳහන් කරන්න.

1. ........................................................................ 2 ..............................................................................

37. යක් ඇනුම නර්තන අංගයේදී භාවිත කරන රංග උපකරණ දෙක ලියන්න.

1. ........................................................................ 2 ..............................................................................



38. ඉහත රූපයෙන් දැක්වෙන නර්තන අංගය සහ එය අයත් ශාන්ති කර්මය කුමක්ද?

1. ............................................................................ 2 ............................................................................

39. 'රෝයල් ඇකඩමි ඩි ලා ඩාන්ස්' යන ප්‍රථම බැලේ නර්තන පාසලෙහි නිර්මාතෘ සහ රට සඳහන් කරන්න.

1. ............................................................................ 2 ............................................................................

40. භාරතීය නෘත්‍ය නාටකයන් සඳහා යොදා ගනු ලබන සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න.

1. ............................................................................ 2 ............................................................................

| A | B | C |
|---|---|---|
| අත් රබාන | ගැටබෙරය | දවුල |
| උඩැක්කිය | දොවොල් බෙරය | තම්මැට්ටම |
| පන්තේරුව | දවුල | හොරණෑව |

41. ඉහත වගුවට අනුව රංග භාණ්ඩ සහ හේවිසි වාදනය සඳහා ගනු ලබන භාණ්ඩ ඇතුළත් කාණ්ඩ අංක දෙක සඳහන් කරන්න.

1. ............................................................................ 2 ............................................................................

42. දේශීය නර්තන සම්ප්‍රදායන්හි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ ඇතුළත් කාණ්ඩ අංකය සහ එහි විතතාතත ගණයට අයත් වාද්‍ය භාණ්ඩය කවරේද?

1. ............................................................................ 2 ............................................................................

43. පහත සඳහන් නර්තන අංග අයත්වන සම්ප්‍රදායන් දක්වන්න.

1. දෙවොල් පද :- ............................................................................

2. මුදුන් තාලය :- ............................................................................

44. කළු යකා සහ රීරි යකා සංකේතවත් කරන වර්ණ දෙක පිළිවෙළින් ලියන්න.


1. ............................................................................ 2. ............................................................................

45. ඉන්දියානු ශිල්පියෙකු විසින් ශ්‍රී ලංකාවේ දී නිර්මාණයකරන කරන ලද ප්‍රථම නෘත්‍ය නාටකය සහ එහි නිර්මාතෘ වන්නේ,

1. ............................................................................ 2. ............................................................................

46. එක් අතකින් සහ දෑතම උපයෝගී කොට ගෙන දක්වන මුද්‍රා හඳුන්වන්නේ කුමන නම් වලින්ද?

1. ............................................................................ 2. ............................................................................




47. ඉහත දැක්වෙන මැක්ස්වෙල් වර්ණ ත්‍රිකෝණයේ ' A' හා 'B' නම් කරන්න.

1. A .................................................................... 2. B ..............................................................................

48. ප්‍රේම කුමාර එපිටවෙල මහතාගේ පරෙවිය මුද්‍රා නාට්‍ය සඳහා සංගීත නිර්මාණයෙන් සහ වේදිකා සැරසිලි නිර්මාණයෙන් දායක වූ ශිල්පීන් දෙදෙනා නම් කරන්න.

1. ...................................................................... 2. ..................................................................................

49. 'උනනු පියන' සහ 'කපාල කුඩුව' යන සැරසිලි අයත් ශාන්ති කර්ම දෙක දක්වන්න.

1. ...................................................................... 2. ..................................................................................

50. ''හඃ කී කට හඬින් - දුර්ගඳ විහිද සැණෙකින් ''.... මෙම කවි පදයෙන් මතුවන භාවය හා රසය කුමක්ද?

1. ...................................................................... 2. ..................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education NWP**

| 52 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ..................................

# නර්තනය (දේශීය) II

කාලය පැය තුනයි

වැදගත්

පළමුවන කොටසින් ප්‍රශ්න <u>දෙකක් ද</u>, II, III, හා IV කොටස්වලින් <u>එක්</u> ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම (I) කොටසට ලකුණු 06 ක් ද, (II) කොටසට ලකුණු 06 ක් ද, (III) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් හිමි වේ.

## I කොටස

01. i. ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා එයට අදාළ අලංකාර බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
    අ. දෝං ජිං ජිං තකට දොම්තකු
    ආ. ගුංද ගතිගත ගත්ත ගුග්ගුද
    ඇ. ජිමිත් තක්කිට තකට ජිංතක

    ii. පහත සඳහන් කවිය මාත්‍රා 3 + 3 තාලයට ප්‍රස්තාර කරන්න.
    'ඉනේ සවඩි රන් කෙඳිවන් - පයේ ගිගිරි වළලු ලවන්
    මෙසේ කොමළ බොළඳ ලියන් - අනේ මලනි දුටොත් කියන්'

    iii. මුසලඩි වන්නමට අදාළ අඩව්වක් ප්‍රස්තාර කරන්න.

02. දේශීය ශාන්ති කර්මයන්හි චරිත නිරූපන කාර්යයේදී විවිධ ශිල්ප ක්‍රම භාවිතා කර ඇත.
    i. නර්තනයක ප්‍රාසාංගික බව කෙරෙහි ගායනය සහ වාදනයෙන් ලැබී ඇති අනුබලය ශාන්ති කර්ම නර්තනාංගයක් ඇසුරින් විස්තර කරන්න.
    ii. ස්වාභාවික අමුද්‍රව්‍ය භාවිතා කරමින් ශාන්ති කර්මවල අංග රචනය සහ රංග වස්ත්‍රාභරණ නිර්මාණය සිදු කර ඇති ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
    iii. වේදිකා ආලෝකකරණය සඳහා යොදාගත් පන්දම් ආලෝකය තුළින් ශාන්ති කර්මවල අවස්ථා නිරූපණය තීව්‍ර වූ ආකාරය විමසන්න.

03. ආනුෂංගික කලාංග අතුරින් නර්තන හා චිත්‍ර කලාව අතර ඇත්තේ මනා සම්බන්ධතාවකි. චිත්‍ර කලාවේ මූලිකාංග ශාන්ති කර්ම තුළ ක්‍රියාත්මක වන ආකාරය පහත ශීර්ෂ ඔස්සේ විමසන්න.
    i. රංග වින්‍යාසය ii. අංග රචනය හා වේශ නිරූපනය iii. මඩු සැරසිලි

## II කොටස

04. '' විවිධ වූ අවශ්‍යතා සඳහා දේශීය වාදන භාණ්ඩ භාවිත කිරීම අතීතයේ සිට ම සමාජය හා බද්ධව පවතී.''
    i. සන්නිවේදන කාර්යයන් සඳහා යොදාගත් වාදන අංග ඇසුරෙන් ඉහත පාඨය සාකච්ඡා කරන්න.
    ii. අනුරාධපුර යුගයේ ආගමික අවශ්‍යතා සඳහා හේවිසි වාදන භාවිත කිරීම පිළිබඳ සාධක දෙකක් දක්වන්න.
    iii. නිර්මාණාත්මක සමූහ වාදන අවස්ථා අද්‍යතනයේ ජනප්‍රිය අංගයක් ලෙස දැකිය හැකිය විමසීමක් කරන්න.

05. 'ගැමි නැටුම් හා ගැමි නාටක ප්‍රභවය ලැබීමේදී විවිධ වූ සංසිද්ධීන් ඒ කෙරෙහි බලපා ඇත.'
   i. ජීවන වෘත්තීන් තේමා කොටගත් ගැමි නැටුම් උදාහරණයට ගෙන ඉහත පාඨය සනාථ කරන්න.
   ii. ගැමි නාටකවල ප්‍රධාන ප්‍රකාශන මාධ්‍ය ලෙස සුවිශේෂී වශයෙන් යොදාගෙන ඇත්තේ නර්තනයයි. සොකරි නාටකයේ අවස්ථා ඇසුරෙන් විමසුමක් කරන්න.
   iii. කෝලම් නාටකවල චරිත නිරූපණය සඳහා වෙස් මුහුණු භාවිතා කිරීම නිරූපන කාර්යයට පිටුවහලක් වේද? සාකච්ඡා කරන්න.

## III කොටස

06. අ, ආ, ඉ රූප සටහන්වලට අදාලව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'අ'



'ආ'



'ඉ'



   i. අ - කොටස
   භාරතීය නෘත්‍ය නාටක කලාව ආරම්භය හා ප්‍රවර්ධනයට දායක වූ ඉහත ශිල්පියා නම්කොට ඔහුගේ දායකත්වය අගයන්න.
   ii. ආ - කොටස
   හංසයාගේ චරිතයට පන පොවා වඩාත් ජනප්‍රියත්වයට පත්වූ ශිල්පිණිය නම්කොට ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.
   iii. ඉ - කොටස
   මෙහි ඇතුළත් නාට්‍ය සම්ප්‍රදාය නම්කොට එහි ප්‍රභවය හා විකාශනය සිදු වූ අයුරු පැහැදිලි කරන්න.

07. i. භාරතීය නෘත්‍ය නාටක 02 ක් නම්කොට නෘත්‍ය නාටක සංකල්පය විස්තර කරන්න.
   ii. බටහිර බැලේ රංගවස්ත්‍රාභරණ සහ අංගරචනය ශිල්පීන්ගේ කාර්ය භාරය පැහැදිලි කරන්න.
   iii. 'මුද්‍රා නාට්‍ය කලාවට පෙර අපරදිග නර්තන සම්ප්‍රදායන්ගෙන් ලද පිටිවහල' මෙම වැකිය ඇසුරෙන් පුවත්පතකට ලිපියක් සකසන්න.

## IV කොටස

08. නර්තනය හැදෑරීම තුළින් කායික, මානසික ස්වස්ථාව මෙන්ම සංස්කෘතික හරයන් දායාද කිරීමක්ද සිදුවේ.
   i. නිරෝගී දිවියකට නර්තනයෙන් ලැබෙන පිටුවහල කෙබඳුදැයි කෙටියෙන් විස්තර කරන්න.
   ii. මානසික ස්වස්ථාව වර්ධනයෙහිලා නර්තන කලාව තුළින් ලැබෙන දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න.
   iii. සංස්කෘතික සාරධර්ම සුරැකීමට නර්තනය ඉවහල්වන ආකාරය පිළිබඳ ඇගයීමක් කරන්න.

09. රූපවාහිනියේ දක්නට ලැබෙන නර්තන අංග විවිධත්වයෙන් හා අනුකරණාත්මක ලක්ෂණ වලින් යුක්තය.
   i. ඔබ නරඹන ලද රූපවාහිනී වැඩසටහන් දෙකක් ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.
   ii. අනුකරණාත්මක ලක්ෂණ නර්තන කලාවේ ප්‍රගමනයට දායක කරගත හැකි ආකාරය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
   iii. උඩරට ශාස්ත්‍රීය නර්තනයට සහ නිර්මාණාත්මක නර්තනයට සුදුසු ශීර්ෂ පළඳනා දෙකක් ඇඳ ඒවා සාදාගන්නා ආකාරය සහ ද්‍රව්‍ය පිළිබඳ විස්තර කරන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දෙවන වාර පරීක්ෂණය - 2018

**13 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 2 | 21. | 5 |
| 2. | 2 | 12. | 4 | 22. | 4 |
| 3. | 3 | 13. | 3 | 23. | 2 |
| 4. | 1 | 14. | 1 | 24. | 3 |
| 5. | 1 | 15. | 2 | 25. | 1 |
| 6. | 5 | 16. | 5 | 26. | මහා වංශය |
| 7. | 2 | 17. | 4 | 27. | ටීකා |
| 8. | 3 | 18. | 2 | 28. | රුසියානු |
| 9. | 4 | 19. | 3 | 29. | තම්මැට්ටම |
| 10. | 5 | 20. | 1 | 30. | මුසලඩි වන්නම |

31. සබරගමු
32. යක් ඇනුම
33. කෝලම් ජන නාටක
34. නාග ගුරුළු
35. ශ්‍රීමති මේනකා
36. 1. පහන් දැලි 2. පොල්තෙල්
37. 1. පොල්පන්දම 2. ඊගහ
38. 1. වඩිග පටුන 2. සූනියම් යාගය
39. 1. iv වන ලුවී රජ 2. ප්‍රංශය
40. 1. හින්දුස්ථාන 2. කර්ණාටක
41. 1. 1 2. 3
42. 1. 2 2. දවුල
43. 1. පහතරට 2. සබරගමු
44. 1. කළු 2. රතු
45. 1. සීතාහරණය 2. ශාන්ති දේව ඝෝෂ්
46. 1. අසම්යුත 2. සංයුත
47. 1. A මොණර නිල 2. B මැජෙන්ටා / රතුවන් දම්
48. 1. ෂෙල්ටන් ප්‍රේමරත්න 2. ඩැනී විමලසිරි
49. 1. රටයකුම 2. සන්නියකුම
50. 1. ජිගුප්සා 2. බීභත්ස්‍ය

## II පත්‍රය - I කොටස

01. i. මාත්‍රා 3+ 4 දෙතිතට අදාල අලංකාර බෙර පදයක් නිවැරදිව ප්‍රස්ථාර කර තිබීම.
නිවැරදි සංකේත භාවිතය - 2 නිවැරදි ප්‍රස්ථාරකරණය - 4 මුළු ලකුණු 06

| 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 | 1́ | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ගු | ගේ | ස | ව | ඩි | + | ගුං | තො | ඳි | ව | ත් |
| + | ජ | යේ | ගි | ගි | රි | + | වළු | ගු | ල | ව | ත් |
| - | - | - | - | - | - | + | රෙ | ගේ | තො | ම | ළි |
| + | බොළු | ඳ | ලි | ය | ත් | + | අ | ගේ | ග | ල | ත් |
| + | දු | ලොත් | කි | ය | ත් | - | - | - | - | - | - |

නිවැරදි සංකේත භාවිතය - 2

නිවැරදි ප්‍රස්ථාරකරණය - 4 ලකුණු - 06 යි.

| ˄1 | 2 | 3 | /1 | 2 | 3 | 4 | ˄1 | 2 | 3 | /1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තා | - | ඳු | තත් | ඳුං | තරි | කිට | ත | ඳු | ද | තත් | - | ජොං | - |
| + | + | + | තත් | - | ජොං | - | ත | ජොං | - | තත් | - | ජොං | - |
| ජි | - | ඳු | ජිත් | ඳුං | තරි | කිට | ජි | ඳු | ද | තත් | - | ජොං | - |
| + | + | + | තත් | - | ජොං | - | ත | ජොං | - | තත් | - | ජොං | - |

• ඉහත ආකාරයට සම්පූර්ණ අඩසව නිවැරදිව ප්‍රස්ථාර කිරීම.

නිවැරදි සංකේත භාවිතය - 02

නිවැරදි ප්‍රස්ථාරකරණය - 06 ලකුණු - 08 යි.

මුළු ලකුණු - 20 යි.

02\. i. ශාන්ති කර්මවල එන නර්තන අංග දීර්ඝ බැවින් කාලය වැඩියෙන් යොදා ගන්නා බවත් රැයක් පහන් වන තුරු පවත්වන බව.
එහිදී ඒකාකාරී බව ගායනය හා වාදනය මගින් බිඳෙන බව.
නර්තනයට ජවයක් මෙන්ම ජීව ගුණයක් ලැබෙන බව.
නර්තනාංගයේ ප්‍රස්තුතයන්ට අදාලව ගායනය, වාදනය යොදා ගැනීම තුළින් එය අර්ථවත් කළ හැකි බව.
ශ්‍රව්‍ය, දෘශ්‍ය මාධ්‍ය දෙකම භාවිතය නිසා ප්‍රේක්ෂකයා වඩාත් ප්‍රාසංගික වින්දනයක් ලබන බව
යනාදී කරුණු උදාහරණ දෙමින් විස්තර කර තිබීම. (ල. 06)

ii. ශාන්ති කර්මවල අංග රචනය සහ රංග වස්ත්‍ර හා ආභරණ සැකසීමට යොදා ගන්නා ස්වාභාවික අමු ද්‍රව්‍ය යොදා ගන්නා ආකාරය පිට වරල්, කන් තෝඩු, වළලු ආදිය නිර්මාණය කර ගැනීම ගොග් කොළ භාවිතා කරන බව. ( උදා. දොවොල්, නානුමුරය)
දහඅට සන්නියේ වර්ණ යෙදූ ඉඳි කොළ, නාව පට්ට, හණ නූල් ආදිය මෙන්ම බුරුල්ල, ගොරක වැනි අතු භාවිතා කරන බව.
කෝල සන්නිය ඉනේ, ඉසේ පිදේනි තටු සඳහා රඹ පතුරු, ගොප් කොළ භාවිතා වන බව.
වෙස් මුහුණු සකස් කර ගන්නා බව.
යක් චරිත සඳහා පහන් දැලි, පොල්තෙල්, හාල්පිටි වැනි ස්වාභාවික අමු ද්‍රව්‍ය යොදා ගන්නා බව.
ස්වාභාවික අමුද්‍රව්‍ය යොදා ගන්නා බව.
මෙවැනි කරුණු දක්වා තිබීම. (ල. 06)

iii. අතීතයේ ශාන්ති කර්මවල අත් පන්දම්, පොල් පන්දම්, විලක්කු ආදියෙන් ආලෝකය සපයා ගත් බව.
ශාන්ති කර්ම රාත්‍රී කාලයෙහි පවත්වන විට එම පන්දම් ආලෝකය වැදී සැරසිලි, රංග භාණ්ඩ, වස්ත්‍රාභරණ මනාව කැපී පෙනෙන බව.
කහ, රතු, කළු, කොළ වැනි තද පැහැ වර්ණ වැඩියෙන් භාවිතාවන බැවින් පන්දම් ආලෝකයෙන් එම වර්ණ තව දුරටත් ඉස්මතුව පෙනෙන බව.
රංග වස්ත්‍රවල අලංකරණය සඳහා අල්ලා ඇති පබළු, සිල්වර් තහඩු, වීදුරු ආදීය පන්දම් එළියට දිස්නය දෙන බව හා පොල්තෙල් තවරා ඇති සැරසිලි දිස්නය දීමෙන් ආලෝකමත් වන බව
අතින් පන්දම් ගෙන කරන පන්දම් පාලිය, දෙකොන විලක්කුව ආදී නර්තන අංග එම පන්දම් ආලෝකය නිසා භයානයක, අද්භූත රස තීව්‍ර වන බව
ආදී කරුණු විමසා කරුණු ඉදිරිපත් කර තිබීම. (ල. 08) මුළු ලකුණු 20)

03\. i. චිත්‍ර වලදී කිසියම් තලයක සහ රංගනයේදී සීමිත අවකාශයක නිර්මාණයක් ගොඩ නගන බව හා අවකාශ භාවිතය මෙම කලාංග දෙකෙහිම ඇති බව.
රංගනයේ අවකාශය ඉහළ, මැද, පහළ වශයෙන් තල දැක්වෙන අතර චිත්‍රවලදී අවකාශය පෙර බිම, මැද බිම, පසු බිම වශයෙන් හඳුන්වන බව.
චිත්‍ර කලාවේ මූලිකාංග රේඛා, හැඩතල, මෝස්තර නර්තනයක ද ඇති බව, යනාදී කරුණු දක්වා තිබීම. (ල. 06)

ii. අංග රචනයේ දී සහ වේශ නිරූපණයේදී ද රේඛා, හැඩතල වර්ණ යන චිත්‍ර කලාවේ මූලිකාංග සම්බන්ධ බව.
රංග වස්ත්‍රාභරණවල විවිධ මෝස්තර යොදා හැඩ ගන්වා ඇති බව ඒවායෙහි රේඛා හැඩතල ඇති බව.
වර්ණ ගලපා ඇති ආකාරය (වෙස් ඇදුම් කට්ටලය සුදු පසුබිමෙහි රතු, කළු වර්ණ කැපී පෙනෙන අයුරින් ද, පහතරට හා සබරගමු ඇඳුම් කට්ටවල වර්ණ ගලපා ඇති අයුරු)
මෙවැනි කරුණු විමසා කරුණු ඉදිරිපත් කර තිබීම. (ල. 06)

iii. මඩු සැරසිලි තුළ ද රේඛා, හැඩතල හා වර්ණ අන්තර්ගත බව.
දේශීය ස්වාභාවික අමු ද්‍රව්‍ය යොදාගෙන ඒවා කලාත්මකව හසුරුවා ඇති බව. ( උදා. ගොක්කොළෙය් සිට වියලි පෙලා කොළය දක්වා වර්න ගලපා ඇති ආකාරය, කෙසෙල් පතුරු ද එලෙස යොදා ගෙන ඇති අයුරු)
විවිධ හැඩ තල යොදා ගනිමින් මල් යහන්, පිදේනි තටු, වීදි තොරණ් ආදිය ගොඩ නගා ඇති අයුරු ඒවායෙහි විවිධ කැටයම්, මෝස්තර යොදා ඇති අයුරු

ඇඟීම්, නෙළීම්, ඇඳීම ආදී සියළු දේ මධු සැරසිලි තුළ දිස්වන බව.
මෙවැනි කරුණු විමසීමට ලක් කරමින් ඉදිරිපත් කර තිබීම. (ල. 08) මුළු ල. 20

**II කොටස**

04. i. අණබෙර, රණබෙර, මළබෙර, වධබෙර ආදී වාදන අංග නම් කිරීම.
අතීතයේ මහජනතාවට රාජ පණිවිඩ ලබාදීමට යොදාගත් විධික්‍රමය අණබෙර ලැවීම බව.
රාජ්‍ය පරිපාලන කටයුතු යුද්දය පිළිබඳ අවස්ථා ජයග්‍රහණ සංකේත කිරීමට රණබෙර වැයූ බව.
අවමංගල්‍ය අවස්ථාවලදී මළබෙර වාදනය කිරීම චාරිත්‍රය බව. මෙහි ආරම්භය ශ්‍රී මහ බෝ සමිදු හා සම්බන්ධ බව. ශෝකයන් මතු කිරීමට දවුල හා තම්මැට්ටම සුදු පිරුවටයකින් ආවරණයක කර වාදනය කිරීම වැනි විධික්‍රම භාවිතා කරන බව. අතීතයේ මේ සඳහා පරම්පරා පැවති බව.
රාජ නීතියට එරෙහිව කටයුතු කරන ලද පුද්ගලයින් රතු වස්ත්‍ර අන්දවා, රත්මල් පළඳවා වධබෙර වයමින් වධබන්ධනයට කැඳවා ගෙන ගිය බව. දැඳුරු බෙර, මහ බෙර, රොද බෙර, ලෙස හඳුන්වා අතීතයේද මෙම වධ බෙර බව ..... ආදී වශයෙන් විස්තර කිරීම. (ල. 06)

ii. දුටුගැමුණු රජු රුවන්වැලි සෑයෙහි ධාතු නිදානෝත්සවයට සහභාගී වීමේදී නානා තූර්ය ඝෝෂක භාවිතා කළ බව.
භාතිකාභය රජු මහාසෑය සඳහා පැවැත්වූ පූජාවක් අතර තූර්ය වාදනද වූ බව.
මහා දැලයාමානනාග රජතුමා මිහින්තලාවේ අම්බස්තල චෛත්‍ය ඉදිකොට සහ වාදන සහිත පුද පූජා කළ බව. එය 'ගිරිභණ්ඩ මහා පූජාව' බව.
දළදා වහන්සේ වෙනුවෙන් අනුරාධපුර යුගයේ සිටම ඇසල පෙරහැර සඳහා තූර්ය වාදන පැවැත්වූ බව.
එක් සාධකයට ල. 3 x 2 = ල. 06

iii. තූර්ය වාදන, ස්ථූප වාදන, ප්‍රසංග වාදන ආදිය අයදතනයේ ජනප්‍රිය බව.
මෙහිදී භාණ්ඩ සමූහයක දැකිය හැකි බව.
දේශීය වාද්‍ය භාණ්ඩ මෙන්ම, විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් නිර්මාණය කරන ලද වාද්‍ය උපකරණ භාවිතා කරන බව..... ආදී කරුණු විස්තර කිරීම. විස්තර කිරීම ල. 08 මුළු ලකුණු 20

05. i. පන්, ගොවි, තේ දලු, මැටි, වේවැල් ..... ආදී වශයෙන් ඇසුරු කොට ගෙන නිර්මාණය කර ඇති ගැමි නැටුම් නම් කිරීම.
එම ගැමි නැටුම් සඳහා පාදක වූ ......................... ක්‍රියාකාරකම් ඒ කෙරෙහි බලපා ඇති ආකාරය විස්තර කරමින් පිළිතුරු ලිවීම. (ල. 06)

ii. ගස් කැපීම, ලී ඉරීම, නැවේ යාම, වී කෙටීම, වී පෙළීම, හාල් ගැරීම, යකඩ තැලීම, පැදුරු විවීම, බත් පිසීම............ වැනි අවස්ථා නම් කිරීම.
මාත්‍රා තුනේ තාලයට අයත් 'දොං ජිජි ගත' බෙර තාලයට හැම ක්‍රියාවක්ම කරන බව
කවි ගායනද මාත්‍රා තුනේ තාලයට ගයමින් එම අවස්ථා නිරූපණය කරන බව.
ආදී කරුණු ලියා ඇත්නම් (ල. 06)

iii. කෝලම් චරිත නම් කිරීම.
සබේ විදානේ හැර අනෙක් කෝලම් චරිත වෙස් මුහුණු පළඳින බව.
කෝලම් නාටකයේ රසය පවතින්නේ නැටුම් නිර්මාණය මෙන්ම. වෙස්මුහුනු නිර්මාණයේ විශිෂ්ඨත්වය මත බව.
එමෙන්ම වෙස් මුහුණු පැළඳීමෙන් සාත්වික අභිනය ප්‍රකාශනයට බාධාවක් වන බව.
වෙස් මුහුණු තුළින් චරිතය පුරාවට ඒකාකාරී බවක් නිරූපණය බව බව.
නර්තන තුළින් දක්වන සක්‍යතාව, ඒ ඒ අවස්ථා අනුව මුහුණින් ඉදිරිපත් කිරීමට නොහැකි බව බව..... ආදී වශයෙන් පිළිතුරු ලිවීම. (ල. 08)

06. i. අ - කොටස
රවීන්ද්‍රනාත් තාගෝර් තුමා
1816 දී කල්කටා නගරයේ බෙංගාලි පවුලක උපත ලද බව
1913 ගීතාංජලී නැමැති ඔහුගේ පරිවර්තන කෘතිය සඳහා නොබෙල් ත්‍යාගය ලබමින් ජාත්‍යන්තර කීර්තියට පත් වූ බව
1917 මනිපුරි දේශයේ සංචාරය කොට පසුව ශාන්තිනිකේතනයේ මනිපුරි නැටුම් ඉගැන්වීමට වෙනම පීඨයක් ආරම්භ කළ බව.
මනිපුරි නර්තනය ඇසුරු කරමින් ශාප්මෝචන්, චිත්‍රාංගදා,චණ්ඩාලික, ශ්‍යාම....... වැනි නාටක නිර්මාණය කල බව.
1941.08.07 දින ජීවිතෙන් සමුගත් බව .......... ආදී කරුණු ලියා ඇත්නම් (ල.07)

ii. ආ - කොටස
ඇනා පවුලෝවා
රුසියාවේ උපත ලද අවු. 10 දී බැලේ ඉගෙනීමට ආරම්භ කළ බව
ඉන්දියානු හා ජපන් නර්තනය හදාරා ඇතිබව.
20 වන සියවසේ ලෝකප්‍රකට නර්තන ශිල්පිණිය වූ බව
ගිසෙල්ලි, මියගිය හංසයා, සිල්ෆීඩ්, හංසවිල යන බැලේ නාට්‍ය සඳහා නර්තන දායකත්වය ලබා දුන් බව.
ආදී කරුණු ලියා අත්නම් ලකුණු 06 යි

iii. ඉ - කොටස
බටහිර බැලේ
15 වනා සියවසේ ඉතාලියේ රාජකීය ප්‍රිය සම්භාෂණවලදී ප්‍රභවය ලැබූ බව
මුල්ම බැලේ නාට්‍ය ඉතාලියේ නිර්මාණය වී 17 වන සියවසේ ප්‍රංශයේ දී ව්‍යාප්ත වූ බව
14 වැනි ලුවී රජු සහ කැතරින් බිසවගේ දායකත්වය
රුසියාව, ඇමරිකාව, ජර්මනිය, එංගලන්තය ආදී රටවල ව්‍යාප්ත වූ බව
හංසවිල, නිදිකුමරිය, නට් ක්‍රැකර් ............... ආදී නිර්මාණ රැසක් බිහි වූ බව ............ ආදී වෙනත් උචිත කරුණු ඇත්නම් ලකුණු පිරිනමන්න (ල. 08)

07. i. කල්පනා, ජීවන රිද්මය, ශාප් මෝචන්, චිත්‍රාංගදා........ යනාදී 02 ක් නම් කර ඇත්නම්
කථකලි නර්තන සම්ප්‍රදාය ඇතුළු අනෙකුත් භාරතීය සම්ප්‍රදායන්ගෙන් ආභාෂය ලබා ඇති බව.

ශිල්පීන්ගේ පුරෝගාමීත්වයෙන් නෘත්‍ය නාටක, බිහි වූ බව.
කථා පුවතක් හෝ සිද්ධි මාලාවක් අන්තර් ගත වීම.
සාත්වික අභිනය ප්‍රබලව යොදා ගෙන ඇති බව.
ප්‍රධාන මාධ්‍යය නර්තනය වීම.
අදහස් ප්‍රකාශය තීව්‍ර කිරීමට සංගීතයන් අවශ්‍යතාවය මත පසුබිම් සංගීතයක් යොදාගෙන ඇති බව.
අභිනය දර්පනය, නාටය ශාස්ත්‍රය වැනි ග්‍රන්ථවල සිද්ධාන්ත ගුරු කොට ඇති බව.
ආගමික කථා, වීර කතා හා ඉන්දියානු දාර්ශනික පසුබිම නෘත්‍ය නාටක තුලින් ඉස්මතු බව බව.
බටහිර ශිල්ප ක්‍රමද සංකලනය කොට ඇති බව
කරුනු අනුව ලකුණු ප්‍රදානය කරන්න. (ල. 06)

ii. විවිධ චරිත සඳහා ඇඳුම් පැළඳුම්, තොප්පි, සපත්තු කොණ්ඩා, මෝස්තර, ආභරණ සැකසීම.
රංග වස්ත්‍ර සකසන ශිල්පීන් විධිමත්ව අංග රචනය ද කරන බව.
රේන්ද, පබළු, දිලිසෙන ද්‍රව්‍ය අලංකරණය සඳහා භාවිතා කරන බව.
'වුවු ' නැමැති සාය සකසා ගන්නා බව.
විදුලි ආලෝකයට සරිලන අන්දමින් වර්ණ තෝරා ගැනීම.
වසර ගණනාවක් භාවිතයට ගත හැකි අයුරින් ඇඳුම් සැකසීම.
චරිත ස්වභාවය අනුව අංග රචනය සිදු කිරීම.
ගැහැනු චරිත මෙන්ම පිරිමි චරිතද වෙස් ගන්වන බව.
විවිධ වර්ණ ගැල්වීමද දක්නට ඇති බව. (ල.06)

iii. පෙර අපරදිග නර්තන හඳුනා ගැනීම.
එක් එක් සම්ප්‍රදායන්හි අනන්‍යතා ලක්‍ෂන
රංගවස්ත්‍රාභරණ, ගායන, වාදන, නර්තන, චලන....... ආදී ආභාසය ලැබීම.
සාම්ප්‍රදායික නර්තන ශිල්පීන්ගේ පුරෝගාමිත්වය
භාරතීය හා බටහිර සංගීතය ඇසුරු කොට ඇති බව
පැනීම්, ඇඟිලි තුඩු වලින් ඇවිදීම, වැනි බටහිර චලන යොදා ඇත බව.
පැනීම්, කැරකීම් වැනි භාරතීය චලන යොදා ඇති බව
රංග වස්ත්‍ර සඳහා බටහරි ආභාෂය ලබා ඇති බව.
නෘත, නෘත්‍ය නාට්‍ය ලක්‍ෂන හා සතර අභිනය යොදාගෙන ඇති බව.
විචාරාත්මක කරුණු ඉදිරිපත් කර ඇත්නම් (ල. 08)

08. i. රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය හා ශරීරයේ මාංශපේශි ශක්තිමත් වන බව
ශරීරයේ නම්‍යතාව ඇති බව
ස්ථුලබව අඩුවීම සිදුවන බව
ශරීර ශක්තිය වර්ධනය වන බව ආදී ලෙස
ගැලපෙන සේ කරුනු දක්වා ඇත්නම් (ල. 06)

ii. නර්තනයේදී අභ්‍යාස වල යෙදීම.
ලය පවත්වා ගැනීම.
තාලය පවත්වා ගැනීම.
ගායනය හා වාදනය අනුව නර්තනයෙහි යෙදීමෙන් ආදී ලෙස කරුණු දැක්වීම. (ල. 06)

iii. ගුරු දෙගුරුන්ට ගරු කිරීම සිදුවන බව.
නායකත්වය ගරු කිරීම සිදුවන බව.
ආගම දහමට නැඹුරුවන බව.
එකමුතුකම, සහජීවනය, අන්‍ය අදහස් වලට ගරු කිරීම.
යනාදී වශයෙන් කරුණු දක්වා ඇත්නම් (ල. 08)

09. i. රූපවාහිනී නාලිකා හා නර්තන වැඩසටහන් නම්කර ඇත්නම්
එම වැඩසටහන් වල අනුකරණාත්මක ලක්ෂණ විස්තර කර ඇත්නම්
රූපවාහිනී වැඩ සටහන් විවිධත්වයෙන් යුක්ත බවට කරුණු දැක්වීම.
විවිධ ශෛලීන්ගේ අනුකරණාත්මක ලක්‍ෂන ඇතිබවට කරුණු දැක්වීම.
යනාදී ලෙස කරුණු දක්වා ඇත්නම් (ල. 06)

ii. විදේශීය නර්තන සම්ප්‍රදායන්ගේ අනුකරණාත්මක ලක්‍ෂණ ගැලපෙන ලෙස යොදා ගැනීමට හැකි බව දක්වා ඇත්නම්
නවීන තාක්ෂණ සමඟ සංගීතය මුසු කිරීම.
බටහිර සංගීත භාණ්ඩ යොදා ගැනීම.
ගායන විවිධ නාදමාලා අනුව සැකසීම.
රංග වස්ත්‍රාභරණ
චලන ස්වභාවයන් යනාදී වශයෙන් දක්වා ඇත්නම් (ල. 06)

iii. සුදුසු ලෙස ශීර්ෂ පළඳනා ඇඳ ඇත්නම්
නිර්මාණාත්මක බව සහ ගැලපෙන බව
යොදාගන්නා අමුද්‍රව්‍ය දක්වා ඇත්නම්
අමුද්‍රව්‍ය යොදා සකසන ආකාරය විස්තර කර ඇත්නම් (ල. 08)